# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2301/37 - 2022 ඔක්තෝබර් මස 12 වැනි බදාදා - 2022.10.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.-බී. 94/47 (VI)

**(269 වන අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනත**

6(2) (ආ) සහ 21(2) (ආ) වගන්ති යටතේ වූ නියමය

(269 වන අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනතේ 6(2)(ආ) වගන්තිය සහ 21(2)(ආ) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මා විසින්, මේ නියමය මගින් -

(1) මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති "පියංගල ආරණ්‍යය සේනාසනය" යනුවෙන් හඳුන්වනු ලබන භූමි ප්‍රදේශය ඉහත කී ආඥාපනතේ කාර්ය සඳහා නාගරික සංවර්ධන ප්‍රදේශයක් බවට ප්‍රකාශයට පත් කරනු ලැබේ; සහ

(2) නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස ඉහත ප්‍රකාශයට පත් කරනු ලැබූ පියංගල ආරණ්‍යය සේනාසනය සඳහා පරිබාහිර සැලැස්මක් සකස් කළ යුතු බවට විධානය කරනු ලැබේ.

**ප්‍රසන්න රණතුංග,**
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2022 සැප්තැම්බර් මස 23 වැනි දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

***පියංගල ආරණ්‍යය සේනාසනය සංයුක්ත වන භූමි ප්‍රදේශය***

නැගෙනහිර පළාතේ අම්පාර පරිපාලන දිස්ත්‍රික්කයේ, උහන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පියංගල (අංක ඩබ්./104/5) ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ වැව්ගම්පත්තු උතුර සුළු කොට්ඨාසයේ පියංගලයාය ග්‍රාමයේ පිහිටි 2022 පෙබරවාරි මස 28 වන දිනැති සර්වේයර් ජනරාල්ගේ අනුරේඛන අංක AM/UHA/2021/190 හි A කැබැල්ල (හෙක්ටයාර් 19.6163) සහ B කැබැල්ල (හෙක්ටයාර් 32.9214) ලෙස නිරූපණය කර ඇත්තා වූ ද ප්‍රමාණයෙන් හෙක්ටයාර් 52.5377 ක ප්‍රමාණයකින් සමන්විත වන්නා වූ පහත දැක්වෙන පරිදි මායිම් වූ සම්පූර්ණ භූමි ප්‍රදේශය :-


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

A කැබැල්ල

උතුරට : පියංගලයාය, PP අම් 4977 හි කැබලි අංක 6, 4, PP අම් 3008 හි කැබලි අංක 1, 2 සහ PP අම් 4977 හි ඉඩම් කැබලි අංක 2;

නැගෙනහිරට : PP අම් 4977 හි කැබලි අංක 2, 4, 6, 7, 8, 9, 11, 12, 13, 15, 16, 18, 19, 21 සහ 22;

දකුණට : PP අම් 4977 පියංගලයාය හි කැබලි අංක 24, 22, PP අම් 4977 හි කැබලි අංක 21, 19, PP අම් 3600 හි කැබලි අංක 1 සහ PP අම් 53 හි කැබලි 4;

බටහිරට : PP අම් 53 හි කැබලි අංක 4, B කැබැල්ල, PP අම් 3601 හි කැබලි අංක 2 සහ පියංගලයාය;

B කැබැල්ල

උතුරට : PP අම් 53 හි කැබලි අංක 4 සහ A කැබැල්ල;

නැගෙනහිරට : A කැබැල්ල, PP අම් 4977 හි කැබලි අංක 9, 10, 11, 13, 14 සහ 15;

දකුණට : A කැබැල්ල, PP අම් 3600 හි කැබලි අංක 1 සහ PP අම් 53 හි කැබලි අංක 4;

බටහිරට : PP අම් 53හි කැබලි අංක 4;

EOG 10-0096

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.